

# ඉහළ ඵලදායකත්වයට උරදෙන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

**අධික රුධිර පීඩනය, පිළිකා සෛල වර්ධනය, දත් දිරායාම යනාදී රෝග තත්ත්ව සමනය කරන ඖෂධීය වටිනාකමකින් යුතු වූ ද උෂ්ණාධික තත්ත්වයන් ගත වෙහෙසන්නන් ගේ සිරුරෙන් පිටවන ජලය නැවත ශරීරයට සපයන ප්‍රතිජීවකයක් ලෙස ද තේ පානය වැදගත් වෙයි.**

වර්ෂ 1873 සිට තේ ලංකාවේ ප්‍රධාන අර්ථික බෝගයකි. තේ දල්ල තුළින් ලංකා ආර්ථිකය සවිමත් කිරීම උදෙසා බිහිවී ඇති ප්‍රධාන ආයතන වන්නේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ පර්යේෂණායතනය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියයි.

ඒ අතරින් කුඩා තේවතු හිමියන් සඳහා පුළුල් වූ කාර්යභාරයක් වර්ෂ 1977 දී ආරම්භ කළ (1975 දී කොල්වින් ආර් ද සිල්වා මහතා මෙයට පදනම දැමීය) කුඩා තේවතු සංවර්ධන අධිකාරිය ඉටු කරයි.

තේවගා බිම් සකස් කිරීම, වගා කිරීම, තේ කොළ හෝ කුඩු ලෙස කර්මාන්තශාලා මගින් නිෂ්පාදනය පමණක් නොව ඇසුරුම් කිරීම යනාදී කාර්යයන් ක්‍රමවත් කිරීම සඳහා අධිකාරිය මග පෙන්වයි. මුදල්, වැවිලි ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ, ප්‍රවාහනය, නවීන තාක්ෂණික උපදෙස් යනාදිය එමගින් ලබාදෙන ප්‍රමුඛ සහනාධාරයන් ය. එම කාර්යන් ගේ සාර්ථකත්වය කෙතරම්ද යත් ශ්‍රී ලංකා තේ නිෂ්පාදනයේ කුඩාවතුවල නිෂ්පාදන දයකත්වය 1985 දී 38% ක් ද, 1991 දී 50% ක් ද වූ අතර වර්ෂ 2005 දී එම ප්‍රමාණය 64.88% ක් විය.

2005 සංගණන වාර්තා අනුව ලංකාවේ කුඩා තේ ඉඩම් 397223 ක් (දිස්ත්‍රික්ක 14 ක් තුළ) පිහිටා ඇති අතර ආවරණය වන බිම් ප්‍රමාණය හෙක්ටයාර් 132.329 කි. එය 1994 වර්ෂය හා සසඳන කල 69.8% ක ඉහළ නැගීමකි.

1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පෞද්ගලික ඉඩම් අයිතිය අක්කර පනහකට සීමා විය. ඒ අනුව විශාලතම පෞද්ගලික ඉඩම අක්කර 50 ක් වූ අතර කුඩාම ඉඩම අක්කර කාලකට සීමා විය.

වාර්තාගත ඉඩම් තුන්ලක්ෂ හත්දහස් දෙසිය විසිතුනක් අතරින්, 75- 80% අතර ප්‍රමාණයක් අක්කරයට වඩා අඩු ඉඩම් ලෙස ද 2-3% අතර ප්‍රතිශතයක් අක්කර දහයට වඩා වැඩි ඉඩම් ලෙස ද සටහන් වෙයි.

සමස්ථයක් ලෙස ශ්‍රී ලංකා තේ වගාවේ ඉහළ ඵලදායකත්වයක් හිමි කුඩා තේවතු අංශය උදෙසා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ලබාදෙන දිරිගැන්වීම් කීපයක් පිළිබඳ මෙලෙස විවරණය කළ හැකිය.

තේ වගාවේ දී පස සූදනම් කිරීම ඉතා වැදගත්ය. ගෝනමාලා හෝ මාන වගාබිමේ ප්‍රථමව වගා කළ යුතු ය. කාලය මාස දහ අටකි. නැතහොත් කොම්පෝස්ට් පොහොර යෙදිය යුතුය. එම ක්‍රියාකාරකම්තුළින් පසේ ජලය වාතය රඳ පැවතීම මෙන්ම ක්ෂුද්‍ර ජීවී ගහණය ද ඉහළ යයි. එලෙස සාරවත් පසක් උදෙසා උපදේශන සේවා ප්‍රාදේශීය නිලධාරීන් සපයයි.

රිකිලි මගින් මෙන්ම බීජ මගින්ද තේ රෝපණය සිදු කරනු ලැබේ. බීජ රෝපණය තුළින් ඇතිවන මව් ශාකයේ ලක්ෂණ නොමැති පැළ හටගැනීම අක්‍රමවත් වර්ධනය ආදී දුර්ගුණ රිකිලි රෝපණය තුළින් මගහරවා ගත හැකිය. එමෙන්ම වැඩි අස්වැන්නක් ලබා ගැනීමටද රිකිලි රෝපණය හේතු වේ. එනිසා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය නව රිකිලි ප්‍රභේද ලෙසT.R. 2000, T.R. 3000, T.R. 4000 හඳුන්වා දී ඇත.

පොහොර සහනාධාරය ක්‍රියාත්මක වනුයේ මෙට්‍රික් ටොන් එකකට රුපියල් දහක වටිටමක් හිමිවන අයුරිනි. තේ ඉඩම් නැවත වගා කිරීමේ දී හෙක්ටයාර් එකකට රුපියල් ලක්ෂ දහයක ණය සහන ලබා දෙයි.

මූල්‍යමය, ද්‍රව්‍යමය ආධාරසේ ම ප්‍රාදේශීය නිලධාරීන් මගින් කෙරෙන දැනුවත් කිරීම් සඳහා ද අධිකාරිය මූල්‍යමය ශක්තිය ලබා ගන්නේ සෙස් බද්ද මූලික කොටගෙනය. අපනයන තේ කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු. 2.50 ක මුදලක් ශ්‍රී ලංකා තේ මණ්ඩලයට හිමි වේ. (සෙස් බද්ද) එහි වාර්ෂික එකතුව රුපියල් මිලියන හත්සියයකි. එම මුදල ඉහත සඳහන් කළ ප්‍රධාන ආයතන තුන අතරේ බෙදී යයි. මෙම බදු මුදල ප්‍රමාණවත් නොවීම මත ශ්‍රී ලංකා මහ බැංකුව හා එක්ව නව වැඩපිළිවෙළක් දියත් කිරීම කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ බලාපොරොත්තුවකි. මාර්ග සංවර්ධන හා ප්‍රවාහන පහසුකම් දුර්වල




මට්ටමක පැවතීම, කුඩා තේ වතු ආශ්‍රිතව පවතින මූලික ගැටලුව බව කුඩා තේ ඉඩම් සංවර්ධන අධිකාරියේ පිළිගැනීමයි. ලබාදී ඇති පහසුකම් ප්‍රමාණවත් නොමැත. එම අඩු-පාඩු මත තේ නිෂ්පාදන ක්ෂේත්‍රයට වන අලා-භය අතිමහත් ය.

උදෑසන නෙලූ තේ දළු, තැලීම්, මැලවීම්, පොඩිවීම් සිදුනොවී සවසට කම්හල වෙත ගෙන යා යුතුය. ගෝනිවල ඇසිරීම, බර කිරී-මට රැගෙනයාම, මඩුවේ තැබීම, ප්‍රවාහනය, තත්ත්ව පාලනයකින් යුතුව කළ යුතු ය. එම ක්‍රියාවලිය ක්‍රමවත්ව සිදු නොවන කල කෙඳි ප්‍රමාණය අඩු, රසායනික සංයෝග වැඩි, ගුණාත්මක තේ කොළ ලබාගත නොහැකිය. විශේෂයෙන් මාතලේ, හඟුරන්කෙත, වලපනේ, නෙලුව, දෙනියාය, බලංගොඩ සහ ඌව දිස්-ත්‍රික්කයේ මාර්ග හා ප්‍රවාහන පහසුකම් ඉතා අයහපත්ව පවතී. මෙම තත්ත්වය අවම කිරීම උදෙසා කුඩා තේවතු සංවර්ධන අධිකාරිය වෙත ආසියානු සංවර්ධන බැංකුව ද දයකත්-වය ලබා දී තිබේ.

කුඩා තේ වතු ක්ෂේත්‍රයේ පැනනැගී ඇති ගැටලු අතර, දළු නෙළීමේ දී සිදුවන අතපසු කිරීම් හා ශ්‍රමය හිඟ වීම ද ප්‍රධානය.

පහත රට තේ දළු නෙළීම උපරිම වශයෙන් දින පහකට වරක් ද, උඩරට දී උපරිම වශ-යෙන් දින හතකට වරක් ද, සිදු කළ යුතු ය. නමුත් විවිධ අවස්ථාවන් හි දී මෙය අතපසු කරන සෙයක් දක්නට ලැබේ. විවිධ උත්සව අවස්ථාවන්හි දී මෙම ගැටලුව ප්‍රබලව ක්‍රියාත්මක වෙයි. අවුරුදු නිවාඩුව තුළ දළු නෙළීම සිදු නොවන්නේනම් දළු මෝරයි. මේරූ

පහත රට තේ දළු නෙළීම උපරිම වශයෙන් දින පහකට වරක් ද, උඩරට දී උපරිම වශයෙන් දින හතකට වරක් ද, සිදු කළ යුතු ය. නමුත් විවිධ අවස්ථාවන් හි දී මෙය අතපසු කරන සෙයක් දක්නට ලැබේ. විවිධ උත්සව අවස්ථාවන්හි දී මෙම ගැටලුව ප්‍රබලව ක්‍රියාත්මක වෙයි. අවුරුදු නිවාඩුව තුළ දළු නෙළීම සිදු නොවන්නේනම් දළු මෝරයි.

දළුවලින් සිදුවන නුසුදුසු නිෂ්පාදන (කසළ තේ) තුළින් තේ වෙළෙඳ පොළට අයහපත් බලපෑම් සිදුවෙයි.

තේ නෙළන්නන්ගේ සමාජ පිළිගැනීම අඩු-වීම මත පහත රට තේවගාවේ ශ්‍රම හිඟයක් පැනනැගී ඇත්තේ කාලාන්තරයක සිට ය. තේ නිෂ්පාදනයේ වැඩිම පිරිවැයක් (35%) වැය-වන්නේද ශ්‍රමය උදෙසා ය.

වර්තමාන තේ වෙළෙඳපොළ දෙස බැලීමේ දී කෙන්යාව, වියට්නාමය (වියට්නාමයේ "හෙක්ටයාර් ඒකක" තේ අස්වැන්න කි. ග්‍රෑම් 4000 - 6000 අතරය, ලංකාවේ එය කි.ග්‍රෑම් 1500 පමණය) ශ්‍රී ලංකාව අභිබවා ඉදිරියට පැමිණිය ද සාම්ප්‍රදායිකව ශ්‍රී ලංකාවට හිමිව ඇති වෙළෙඳපොළ එලෙසම පවතී. (ලංකාවේ විවිධ දේශගුණික තත්ත්ව තුළ විවිධ රස-යෙන් යුත් තේ නිෂ්පාදනය සිදු වෙයි. ලංකාවේ අනන්‍යතාව එයයි. යුරෝපීයයන් වැඩි වශ-යෙන් උඩරට තේ ඉල්ලුම් කරන අතර පහත රට තේ මැද පෙරදිග රටවලට අපනයනය කරයි. කෙන්යාව 100% ක් සී.ටී.සී. නම් නවීන ශිල්පීය ක්‍රමය (කැපුණු, ඉරුණු, සුරුත්ඩු වූ තේ) මගින් තේ නිපදවීමත්, ශ්‍රී ලංකාව සාම්ප්‍ර-දායික ඔතඩොක් ක්‍රමය තුළින් (තව්මැරීම, ඇඹරීම, පැසවීම) තේ නිපදවීමත් නිසා ලංකා තේ නිෂ්පාදනයේ වර්ධනයට බාධා වී තිබේ.

ප්‍රමිතියෙන් යුත් තේදළු නෙළමින්, වැඩිවෙ-මින් පවතින කසළ තේ නිෂ්පාදනය අවම කිරීම සඳහා කුඩා තේවතු හිමියන් ගේ පූර්ණ අවධානය ලබා ගැනීමට කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය කටයුතු කරන අතර වතු හිමියන් ගේ පූර්ණ සහයෝගය ද ඒ කෙරෙහි දැක්විය යුතුව ඇත. බිම් සැකසීම, පැළ රෝපණය, පාඩු මැකීම, කප්පාදුව හා නැවත වගාව ද ක්‍රමවත්ව කළ යුතු බවට කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය අවධාරණය කරයි.

**තොරතුරු ලබාදීමේ දයකත්වය -**
**කුඩා තේ ඉඩම් සංවර්ධන අධිකාරියේ**
**නියෝජ්‍ය ප්‍රධාන කළමනාකරු -**
**එස්.ඩී. නන්දසේන මහතා**

❑

සටහන - **පුබුදු කිත්සිරි**